සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ධාන්‍ය හා මාෂ බෝග පිළිවෙලින් වනුයේ,
(1) මුං ඇට සහ කඩල ය. (2) කඩල සහ පරිප්පු ය.
(3) කුරක්කන් සහ කවුපි ය. (4) සෝයා බෝංචි හා බඩ ඉරිඟු ය.

(02) බීටා කැරොටීන් බහුලව අඩංගුවන ආහාර ප්‍රභව දෙකකි,
(1) වට්ටක්කා සහ ලාවුළු
(2) බිත්තර කහමද සහ බටර්
(3) කටු සහිත මාළු වර්ග සහ කිරි නිෂ්පාදන
(4) පීකුදු සහ කැරට්

(03) තිරිඟු සහ ඉරිඟුවල අඩංගු ප්‍රෝටීන් පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඉලාස්ටින් හා කේසීන් (2) ඔරයිසීන් හා ලෙගියුමින්
(3) ග්ලූටනින් හා සෙයින් (4) කේසීන් හා සෙයින්

(04) යකඩ ඌනතාවයෙන් පෙළෙන දරුවෙකුගේ ආහාර වේලට එක් කළ යුතු පලා වර්ගයක් වනුයේ,
(1) නිවිති ය. (2) කතුරුමුරුංගා ය. (3) කංකුං ය. (4) ගොටුකොළ ය.

(05) අධික ලෙස කැල්සියම් අඩංගු ධාන්‍ය වර්ගයක් වනුයේ,
(1) නිවුඩු සහල් ය. (2) තම්බන ලද සහල් ය.
(3) කුරක්කන් ය. (4) තිරිඟු ය.

(06) නිර්දේශිත පෝෂණ අවශ්‍යතා සටහනෙහි, ග්‍රෑම්වලින් දක්වා ඇති පෝෂක වනුයේ,
(1) මේද සහ ප්‍රෝටීන් ය. (2) යකඩ සහ කැල්සියම් ය.
(3) මේද සහ යකඩ ය. (4) ප්‍රෝටීන් සහ ශක්තිය ය.

(07) පහත දක්වෙනුයේ "X" නැමති රෝගය හා සම්බන්ධ රෝග ලක්ෂණය කිහිපයකි.
- නීරක්තිය.
- හතිය හා සුදුමැලි බව.
- ඉක්මනින් විඩාවට පත් වීම.
- පහසුවෙන් ලෙඩ රෝගවලට ගොදුරු වීම.

"X" රෝගය වැළඳීම වැළැක්වීමට ලබා ගත යුතු ඛනිජ වර්ගය වනුයේ,
(1) කැල්සියම් ය. (2) යකඩ ය. (3) අයඩීන් ය. (4) මැග්නීසියම් ය.

(08) සගන්ධය දක්නට ලැබෙන පළතුරු වර්ග වනුයේ,

(1) දෙහි හා ගස්ලබු ය. (2) කෙසෙල් සහ දූරියන් ය.

(3) අන්නාසි සහ නාරං ය. (4) දෙළුම් සහ දොඩම් ය.

(09) ශීතකරණයක $7^{o}C$ - $10^{o}C$ අතර උෂ්ණත්වයක ගබඩා කළ යුතු ආහාර වර්ග වනුයේ,

(1) මස් සහ මාළු ය. (2) එළවළු වර්ග ය.

(3) පලා වර්ග ය. (4) පළතුරු වර්ග ය.

(10) ආහාර පිළියෙල කිරීමේ දී යකඩ අවශෝෂණය පහසු වීම සඳහා එක් කළ හැකි දේශීය රස කාරකයක් වනුයේ,

(1) කහ ය. (2) දෙහි ය. (3) ලූණු ය. (4) තක්කාලි ය.

(11) පාන්, බනිස් පැටිස් හා මාළුපාන් වැනි ආහාර සකස් කිරීමේ දී, මෘදු වයනය ලබා ගැනීම සඳහා උපයෝගී වන ශිල්පීය ක්‍රමය වනුයේ,

(1) මිශ්‍ර කිරීම ය. (2) පදම් කිරීම ය.

(3) කලවම් කිරීම ය. (4) අත් ගැසීම ය.

(12) බිත්තර සුදුමද පෙන නගින තෙක් ගසා ගෙන, වාතය ඇතුළු කිරීම මගින් සකස් කරන ආහාර වර්ගයක් නොවනුයේ,

(1) මාෂ්මෙලෝස් ය. (2) චූ පේස්ට්‍රි ය.

(3) ෂෝට් ක්‍රස්ට් පේස්ට්‍රි ය. (4) කිසස් ය.

(13) ගැඹුරු තෙලේ පිසීමේ ක්‍රමයට පිස ගත නොහැකි, දේශීය කැවිලි වර්ගයක් වනුයේ,

(1) කොකිස් ය. (2) දොදොල් ය.

(3) මුං කැවුම් ය. (4) නාරං කැවුම් ය.

(14) වෙනත් උදුනක සහාය නොමැතිව ක්‍රියාත්මක වීමට නොහැකි උදුන් වර්ගයක් වනුයේ,

(1) භූමිතෙල් උදුන ය. (2) ගෑස් උදුන ය.

(3) විදුලි උදුන ය. (4) පීඩන උදුන ය.

(15) වැඩි සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයක සිට, අඩු සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයකට ද්‍රව අංශු ගමන් කිරීම හඳුන්වනුයේ,

(1) විසරණය යනුවෙනි. (2) බාහිර ආස්‍රැතිය යනුවෙනි.

(3) ආර්ද්‍රතාව යනුවෙනි. (4) ඔක්සිකරණය යනුවෙනි.

(16) ආහාර නරක්වීම කෙරෙහි බලපාන බාහිර සාධකයක් වනුයේ,

(1) ආහාරයේ pH අගය ය.

(2) උපස්තරය ය.

(3) ප්‍රශස්ත උෂ්ණත්වය ය.

(4) ආහාරයේ අඩංගු ජල ප්‍රමාණය ය.

(17) රුධිරය කැටි ගැසීමේ කාරකය වන "ප්‍රෝත්‍රොම්බින්" නිපදවීමට අවශ්‍ය විටමිනය වනුයේ,

(1) විටමින් A ය. (2) විටමින් K ය.

(3) විටමින් E ය. (4) විටමින් B ය.

(18) ඩිම්බ කෝෂවලින්, පරිනත ඩිම්බයක් පැලෝපීය නාලය තුළට නිකුත් කරනුයේ,

(1) දින 28කට වරක් ය.
(2) දින 72කට වරක් ය.
(3) දින 56කට වරක් ය.
(4) දින 42කට වරක් ය.

(19) ස්ත්‍රී ලිංගික හෝමෝන වනුයේ,

(1) ප්‍රොජෙස්ටරෝන් සහ ටෙස්ටොස්ටෙරෝන් ය.
(2) ටෙස්ටොස්ටෙරෝන් සහ ඊස්ට්‍රජන් ය.
(3) ඊස්ට්‍රජන් සහ ඇන්ඩ්‍රජන් ය.
(4) ඊස්ට්‍රජන් සහ ප්‍රොජෙස්ටරෝන් ය.

(20) ගර්භණී මවකගේ ශරීරයේ හෝමෝන නිසා විවිධ වෙනස්වීම් සිදුවේ. එම වෙනස්වීම් දෙකක් වනුයේ,

(1) ආර්ථවය නැවතීම හා නිතර මුත්‍රා පිට කිරීමේ අවශ්‍යතාවය ඇතිවීම ය.
(2) ඇතැම් ආහාරවලට අසාත්මිකතා තත්ත්ව ඇතිවීම හා ආර්ථවය නැවතීම ය.
(3) ගර්භණී මුල් අවධියේ කෑම රුචිය ඇතිවීම හා උදරය විශාල වීම ය.
(4) නිතර මුත්‍රා පිට කිරීමේ අවශ්‍යතාවය හා ඇදුම රෝගය වැළඳීම ය.

(21) ගර්භණී අවධියේ දී ඇතිවන උදෑසන ඔක්කාරය පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ,

(1) සැහැල්ලු රාත්‍රී ආහාරයක් ගැනීම ය.
(2) උදය ආහාරය ගැනීම පමා කිරීම ය.
(3) උදෑසන පිබිදීමෙන් අනතුරුව වියළි ආහාරයක් ගැනීම ය.
(4) උදෑසන පිබිදීමෙන් අනතුරුව වතුර වීදුරුවක් පානය කිරීම ය.

(22) කලල අවධිය තුළ සිදුවන සංවර්ධනය පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

(1) සියලු ම අවයව සකස් වී මිනිස් රූපයක හැඩය ගැනීම සිදු වේ.
(2) සංසේචනය වීමත් සමග සෛල බෙදීම ආරම්භ වේ.
(3) සෛල පොකුරක් ලෙස පැලෝපීය නාලය ඔස්සේ ගර්භාෂයට පැමිණේ.
(4) අධිරෝපණය වීම හා කළලය තවදුරටත් වර්ධනය වීම සිදුවේ.

(23) යොවුන් විය බෙදිය හැකි අවධි ගණන,

(1) 3 කි.
(2) 6 කි.
(3) 4 කි.
(4) 5 කි.

(24) පරිනත ඩිම්බයක් හා ශුක්‍රාණුවක් සංසේචනය වීම සිදුවන්නේ,

(1) ඩිම්බ කෝෂ තුළ දී ය.
(2) පැලෝපීය නාල තුළ දී ය.
(3) ගර්භාෂය තුළ දී ය.
(4) ගර්භාෂ ග්‍රීවය තුළ දී ය.

(25) පහත දක්වෙන්නේ දරුවන් පිළිඹිබු කරන ලක්ෂණ කිහිපයකි.

A - නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව ඇත.
B - චිත්තවේග පාලනයේ ගැටලුකාරී බවක් පෙන්නුම් නොකරයි.
C - සම වයසේ කණ්ඩායම් කෙරෙහි වැඩි ඇල්මක් ඇත.
D - වීරාභිවන්දනය පෙන්නුම් කරයි.

මින් යොවුන්විය හා සම්බන්ධ ලක්ෂණ වනුයේ,

(1) A, B හා C ය.
(2) A, C හා D ය.
(3) A, B හා D ය.
(4) B, C හා D ය.

(26) ගර්භාෂය තුළ සිදුවන සංසිද්ධියකි,

(1) ඩිම්බ පරිනතිය
(2) ඩිම්බ මෝචනය
(3) කළල අධිරෝපණය
(4) සංසේචනය

(27) පූර්ව ප්‍රසව සංවර්ධන අවධියේ දී කළලයේ පෝෂණය සඳහා සැකසෙන සුවිශේෂී ව්‍යුහමය කොටස වනුයේ,

(1) කලල බන්ධ ය.
(2) ඇම්නියෝටික් කුහරය ය.
(3) අන්තඃජදය ය.
(4) පෙකණි වැල ය.

(28) රෙදි දොපොටක් මූට්ටු කිරීමට පෙර, එකට රඳවා තබා ගැනීමට යොදා ගනු ලබන මැහුම් ක්‍රමය වනුයේ,

(1) නැටි මැස්ම ය.
(2) දම්වැල් මැස්ම ය.
(3) පිස්මේන්තු මැස්ම ය.
(4) නූල් ඇදීම ය.

(29) යොදනු ලබන මැස්ම, රෙද්දෙහි හොඳ පිටින් දැකිය හැකි මූට්ටුවකි,

(1) විවෘත පැතලි මූට්ටුව
(2) ප්‍රංශ මූට්ටුව
(3) අතිඡාදන මූට්ටුව
(4) සරල මූට්ටුව

(30) නයිලෝන් හා ටෙරලින් යන කෙඳි වර්ග අයත් වනුයේ,

(1) ශාකමය කෙඳි කාණ්ඩයට ය.
(2) කෘත්‍රිම කෙඳි කාණ්ඩයට ය.
(3) අර්ධ කෘත්‍රිම කෙඳි කාණ්ඩයට ය.
(4) ඛනිජමය කෙඳි කාණ්ඩයට ය.

(31) ඇඳුමක වාටියක් වඩාත් අලංකාර කළ හැකි මැහුම් ක්‍රම දෙකකි,

(1) ලේසිඩේසි මැස්ම හා දම්වැල් මැස්ම
(2) කතිර මැස්ම හා සැටින් මැස්ම
(3) බ්ලැන්කට් මැස්ම හා ගැට පිස්මේන්තු මැස්ම
(4) බුලියන් මැස්ම හා ප්‍රංශ ගැට මැස්ම

(32) ළදරු ඇඳුමෙහි, අත්කටෙහි කිහිළි නැම්ම ශක්තිමත් කිරීම සඳහා යෙදිය හැකි මැස්මකි.

(1) පිස්මේන්තු මැස්ම
(2) සැටින් මැස්ම
(3) වාටි මැස්ම
(4) බ්ලැන්කට් මැස්ම

(33) "අක් සැරසිලි" සඳහා අයත්වන නිදසුන් කිහිපයකි,

(1) ලේසි ඩේසි මැස්ම, බඳන යෙදීම හා සිහින් ඔපනැලි යෙදීම.
(2) බඳන යෙදීම, රේන්ද ඇල්ලීම හා රැළිපටි ඇල්ලීම.
(3) සිහින් රැළි යෙදීම, බ්ලැන්කට් මැස්ම හා රේන්ද ඇල්ලීම.
(4) රැළිපටි ඇල්ලීම, වාටි මැස්ම හා නැටි මැස්ම යෙදීම.

(34) මූලික මැහුම් ක්‍රම දෙකක් වනුයේ,

(1) නැටි මැස්ම හා වාටි මැස්ම ය.
(2) පිස්මේන්තු මැස්ම හා සැටින් මැස්ම ය.
(3) හීන් නූල් දුවවීම හා සැඟිවාටි මැස්ම ය.
(4) කතිර මැස්ම හා දම්වැල් මැස්ම ය.

(35) රෙදි පිරියම් කිරීම යනුවෙන් හඳුන්වනුයේ,

(1) රෙද්ද මතුපිට මෝස්තර මැසීම ය.
(2) රෙද්දේ ඇති කුණු ඉවත් කිරීම ය.
(3) රෙද්දේ ඇති දෝෂ ඉවත් කිරීම ය.
(4) රෙද්දට කැඳ දැමීම ය.

(36) ආර්ථික වශයෙන් හා දරුවන් හදාවඩා ගැනීමේ දී සහයෝගීව කටයුතු කරන පොදු නිවසක් තුළ ජීවත්වන විවාහක යුවලක් හෝ පිරිපුන් වයසැති ඥාතීන් සිටින ඒකකය ''පවුල'' නම් වේ. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද මානව විද්‍යාඥවරිය වනුයේ,

(1) පැවොලුසි ය. (2) කැතලින් ගැෆ් ය.
(3) මර්ඩොක් ය. (4) හොක් ය.

(37) මානව හා සමාජ විද්‍යාඥයින් දක්වන පරිදි පවුල කොටස් දෙකකින් සමන්විත වේ. මෙම පවුල්,

(1) න්‍යෂ්ටික පවුල හා විස්තෘත පවුල ලෙස හැඳින්වේ.
(2) ඒකීය පවුල හා අණු පවුල ලෙස හැඳින්වේ.
(3) සංයුක්ත පවුල හා ව්‍යාප්ත පවුල ලෙස හැඳින් වේ.
(4) සමීප පවුල හා මූලික පවුල ලෙස හැඳින් වේ.

(38) පවුලේ දරුවන් විවාහ වී, නිවසින් වෙන්ව ගිය පසු දෙමාපියන් තනිවන අවධිය,


(1) වර්ධක අවධිය වේ. (2) ආරම්භක අවධිය වේ.
(3) සංයුක්ත අවධිය වේ. (4) සංකෝචන අවධිය වේ.

(39) නිවසක් ගොඩනැගීමේ දී සැලසුම් සකස් කිරීමට වඩාත් උචිත ක්‍රමයක් වනුයේ,

(1) භූමියේ හැඩය හා පිහිටීම වෙනස් නොකර, ඒ අයුරින්ම නිවාස ගොඩනගා ගැනීමයි.
(2) පරිසරයට හානි ඇතිවන ස්ථානවල භූමියෙහි නිවාස ඉදිකිරීමයි.
(3) පස් කඳු කඩා වැටීමට ලක්විය හැකි ස්ථාන අතහැර, ඒ අසල නිවාස සැලසුම් කිරීමයි.
(4) අලංකාරය පිළිබඳව පමණක් සිතා නිවාස සැලසුම් කිරීමයි.

(40) විවිධ කාර්යයන් අවම ශ්‍රමයකින් සිදු කර ගැනීමට හා උපරිම පහසුකම් සලසාගත හැකි ආකාරයට නිවසේ කොටස් යාබදව ගොනු කිරීම හඳුන්වන්නේ,

(1) නම්‍යතාවය වශයෙනි. (2) රාශිකරණය වශයෙනි.
(3) පරිමාණය වශයෙනි. (4) සංචාතනය වශයෙනි.



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් ඡේදය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නගරයෙන් පිටත ග්‍රාමීය ප්‍රදේශයක ගුරු සේවයේ යෙදී සිටින ජයවර්ධන යුවල දියණියන් දෙදෙනෙකුගේ දෙමව්පියෝ වෙති. දියණියෝ පස්වන ශ්‍රේණියේ සහ පළමු ශ්‍රේණියේ ඉගෙනුම ලබති. ජයවර්ධන මහත්මිය ගර්භණීභාවයේ පසු අවධියෙහි පසුවන අතර, ඇයගේ පියා ද ඔවුන් සමඟ ජීවත් වෙයි. ජයවර්ධන යුවලගේ ජීවිත අරමුණක් වනුයේ ඉදිරි කාලයේ දී පිය උරුමයෙන් ලද නාගරික ප්‍රදේශයෙහි පිහිටි ඉඩමෙහි නිවසක් තනා ගැනීම ය.

(i) ගර්භණී අවධියේ පසුවන ජයවර්ධන මහත්මියට අයඩීන් අඩංගු ආහාර ප්‍රමාණවත් පරිදි නොලැබීම නිසා ඇතිවිය හැකි තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

(ii) නිර්මාංශික වූ ජයවර්ධන පවුලට සුදුසු උදෑසන ආහාර වේලක් ලියා දක්වන්න.

(iii) ජයවර්ධන මහත්මියගේ පියා අස්ථි ක්ෂීණතාව හෙවත් ඔස්ටියෝ පොරෝසිස් රෝගයෙන් පෙළේ. එම රෝගය ඇති වීමට බලපා ඇත්තේ කවර පෝෂක ඌනතාවයක් ද?

(iv) යහපත් පවුලක් තුළින් දැකිය හැකි ගති ලක්ෂණ හතරක් නම් කරන්න.

(v) නිවස ගොඩනැගීමට පෙර, සලකා බැලිය යුතු යටිතල පහසුකම් දෙකක් සඳහන් කරන්න.

(vi) දියණියන් දෙදෙනාගේ පාසල් නිල ඇඳුමෙහි සාය සඳහා යොදා ගත හැකි පොලොව් වර්ග දෙකක් සඳහන් කරන්න.

(vii) ළදරු ඇඳුමක කර හා වාටිය අලංකාර කර ගැනීමට යොදා ගත හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(viii) දරුවන්ගේ වතුර බෝතල ආවරණය සඳහා ලේසි ඩේසි මැස්මෙන් මැසීමට සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න.

(ix) ගර්භණීභාවයේ පසුවන ජයවර්ධන මියගේ යකඩ අවශ්‍යතාවය වැඩි වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න.

(x) මෙම පවුලෙහි දියණියන් දෙදෙනා පසුවන සංවර්ධන අවධි නම් කරන්න.


(ලකුණු 2 × 10 = 20)

(02) (i) ළදරු ඇඳුම් සඳහා රෙදි තෝරා ගැනීමේ දී සැලකිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) වතුර බෝතලයක් සඳහා ක්විල්ට් කර මසන ලද ආවරණයක් යොදා ගැනීමෙන් සැලසෙන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ළදරු ගවුම් පතරොමෙහි රූප සටහනක් පහත දක්වා ඇත. a, b,c හා d වලින් දක්වා ඇති මිම් සඳහා මිනුම් ප්‍රමාණ සෙන්ටිමීටරවලින් දක්වන්න. (ලකුණු 04)

(a) A සිට D දක්වා
b) B සිට C දක්වා
(c) B සිට D දක්වා
(d) E සිට N දක්වා




(03) (i) ප්‍රෝටීන් පරිපූරණය හඳුන්වන්න. (ලකුණු 03)

(ii) කෑම මේසය මතට මල් සැකසුමක් සැකසීමේ දී සිත තබාගත යුතු කරුණු කවරේ ද? (ලකුණු 03)

(iii) පහත දැක්වෙන දෑ හඳුන්වන්න.
(a) මහා පෝෂක (b) ආහාර ආකලන (ලකුණු 04)

(04) (i) අපරදිග ක්‍රමයට කෑම මේසය සකස් කිරීමේ දී, මේස ඇතිරිල්ල මත අනු ඇතිරිල්ල දැමීමේ අරමුණු කවරේ ද? (ලකුණු 03)

(ii) නිවසේ දී භාවිත කරන පරිරක්ෂණ කාරක තුනක් නම් කර, ඒවා යොදා ගනු ලබන ආහාර වර්ගය බැගින් දක්වන්න. (ලකුණු 03)

(iii) පහත සඳහන් දෑ හඳුන්වන්න.
ආහාර පිළියෙල කිරීමේ දී, (a) අත් ගෑසීම
(b) පදම් කිරීම (ලකුණු 04)

(05) (i) භෞතික සම්පත් හතරක් සහ භෞතික නොවන සම්පත් දෙකක් නම් කරන්න.(ලකුණු 03)

(ii) ඉහත නම් කරන ලද භෞතික නොවන සම්පතක් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) පාසලේ පැවැත්වෙන සිංහල අවුරුදු උත්සවය සංවිධානය කිරීමට 10වන ශ්‍රේණියේ ගෘහ ආර්ථික විද්‍යා විෂය හදාරන සිසුන්ට පැවරී ඇතැයි සිතන්න. මෙම උත්සවය සඳහා මානව සම්පත් උපයෝගී කරගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(06) (i) යොවුන් විය හඳුන්වන්න. (ලකුණු 03)

(ii) කලල අවධිය තුළ සිදුවන අධිරෝපණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) යෙවුන් අවධියට සුවිශේෂී වූ ලක්ෂණ යෞවනයාගේ සමාජ සංවර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කරයි. එබඳු ලක්ෂණ දෙකක් උදාහරණ ලෙස ගනිමින් මෙය සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(07) (i) ගර්භණී මවක් විසින් පිළිපැදිය යුතු සෞඛ්‍ය පුරුදු තුනක් දක්වන්න. (ලකුණු 03)

(ii) මුල් ළමාවිය දරුවන්ගේ භාෂා වර්ධනය සඳහා නිවසේ දී ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) පහත දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(a) යුක්තාණුව (b) පෙකිණි වැල (ලකුණු 04)